# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
## தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
## DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka.

**Web Site** : www.treasury.gov.lk **e-mail** : budget@nbd.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. } BD/103/03/1616

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017.07.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

<u>අයවැය කැඳවීම - 2018 සඳහා අතිරේකය I</u>
<u>අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් ඉදිරිපත් කිරීම</u>

මෙය ඔබ වෙත දැනටමත් එවා ඇති 2017.07.25 දිනැති අංක BD/CBP/4/1/2/2018 දරන අයවැය කැඳවීම - 2018 ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඔබ මැනවින් දන්නා පරිදි, වියදම් කිරීමේ ආයතන වෙත කාර්යක්ෂම, ඵලදායී මූල්‍ය විසඳුම් සහ තොරතුරු ලබාදීම පිණිස සියලුම මූල්‍ය ගනුදෙනු ඒකාබද්ධ කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) නම් මෘදුකාංග පද්ධතියක් මහා භාණ්ඩාගාරය විසින් සකස් කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහායෙන් 2017 වර්ෂයේදීද නියමු ව්‍යාපෘතියක් ලෙස සිදු කරන ලදී.

03. මේ වනවිට 2018 වර්ෂයේ සිට ඉදිරියට දත්ත ඇතුළත් කිරීම සඳහා මෙම පද්ධතිය සූදානමින් පවතී. පද්ධතියේ අයවැය මොඩියුලය සියලුම වියදම් කිරීමේ ආයතන වෙත ප්‍රවේශ වීම සඳහා මේ වනවිට සූදානමින් පවතී. කෙසේ වෙතත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අයවැය සකස් කිරීමේ පද්ධතිය (BFS) හා ITMIS යන පද්ධතීන් ද්විත්වයම මේ වසරේදී සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන අතර, 2018 වර්ෂය අවසානයේදී BFS පද්ධතිය භාවිතයෙන් ඉවත් කෙරෙනු ඇත.

04. එම නිසා, 2018 වර්ෂය සඳහා වන අයවැය සංඛ්‍යාංක ඔබ විසින් නව පද්ධතියට සෘජුවම ඇතුළත් කර එහි දෘඪ පිටපතක් නිර්දේශ කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවීම අනිවාර්ය වේ. අයවැය සැලසුම් කිරීම, අයවැය ක්‍රියාත්මක කිරීම සහ වාර්තා කිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් භාවිතා කෙරෙනු ලබන එකම පද්ධතිය නුදුරේදීම ITMIS පමණක්ම වනු ඇත. අනාගතයේදී බැංකු හෝ ආයතන හෝ පුද්ගලයින් වෙත සෘජු ගෙවීම් නිදහස් කිරීම වැනි නව පහසුකම් මෙම පද්ධතිය මගින් සපයනු ලැබේ. තවද, අයවැය පාලන / සීමාවන් පැනවීම, අතිරේක අයවැය සඳහා වන මාර්ගගත ඉල්ලීම් , (online request) අයවැය සැලසුම් හරහා ගිණුම් කේතයන්හි අද්විතීය ප්‍රතිපාදන

සටහන් අනුගමනය කරමින් (Unique Chart of Account Codes) අයවැය ක්‍රියාත්මක කිරීම සහ වාර්තා කිරීම ආදිය සඳහාද එය උපකාරී වේ.

05. ITMIS හිදී, මධ්‍යම මට්ටමේ කාර්යාලයන්හි අයවැය පරීක්ෂා කිරීමට පහසුකම් සැලසීම සඳහා සහ දැරීමට සිදුවන සත්‍ය ගනුදෙනු පිළිබඳ අයවැය සීමාවන් ස්ථාපිත කිරීම සඳහා වියදම් ඒකක (මධ්‍යම / උප කාර්යාල) මට්ටමින් අයවැය ඇස්තමේන්තු පිළියෙල කෙරෙනු ඇත. මෙම කාර්යය කඩිනම් කිරීම සඳහා දැනටමත් වියදම් ඒකක මට්ටමින් ද ITMIS පුහුණුව ලබාදී ඇති නිලධාරීන් නම් කර ඔවුන්ගේ තොරතුරු ජංගම දුරකථන අංකද සමග 2017.07.28 වන දින වනවිට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වියදම් කිරීමේ ආයතන, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ITMIS අතර සන්නිවේදන කටයුතු සඳහා අවශ්‍ය වන මුරපද සහ විද්‍යුත් තැපැල් තොරතුරු මෙම නිලධාරීන් වෙත ලබාදෙනු ඇත.

06. අයවැය සැලසුම් කිරීම සඳහා ITMIS පද්ධතිය සාර්ථකව සහ කාලෝචිත අයුරින් භාවිතා කිරීම සඳහා ITMIS අයවැය සැලසුම් පද්ධතිය භාවිතා කරනු ලබන ආකාරය පිළිබඳව මේ වනවිටත් නිලධාරීන් පුහුණු කර ඇත. 2017 මැයි මස 08 සහ 26 වන දින වැඩමුළු පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා සහභාගී වීමට නොහැකි වූ නිලධාරීන් සඳහා තවත් වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කෙරෙනු ඇත. නම් කරන ලද පරිශීලකයින්ට 2018 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු ITMIS පද්ධතියට ඇතුළත් කිරීමට හැකිවනු පිණිස ITMIS හි නව ගිණුම් සටහන (New chart of Accounts) හා අයවැය සැලසුම් මොඩියුලය (Budget Planning Module) පිළිබඳව වන පුහුණුවක් ඔවුනට අගෝස්තු මාසය තුළදී ලබාදෙනු ඇත. එම නිසා, ITMIS අයවැය සැලසුම් මොඩියුලය පිළිබඳව පුහුණු කිරීමට අවශ්‍ය වන පරිශීලකයින් නම් කොට ඔවුන්ගේ තොරතුරු info@fempsl.org වෙත විද්‍යුත් තැපැල මගින් යොමු කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිනු ලැබේ. මෙම තොරතුරුවලට, දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ ගිණුම් ශීර්ෂ අංකය, දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ නම සහ පරිශීලකයින්ගේ මුල් නම, අවසන් නම, මුලකුරු සමග නම, තනතුර, දුරකථන අංකය, ජාතික හැඳුනුම්පත් අංකය, උපන් දිනය, විද්‍යුත් ලිපිනය හා පුහුණුවීමට අපේක්ෂිත භාෂාව යන තොරතුරු ඇතුළත් විය යුතුය.

නව පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සළකමි.

කේ.ඩී.එස්.රුවන්චන්ද්‍ර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

I. ජනාධිපති ලේකම්
II. අග්‍රාමාත්‍ය ලේකම්
III. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
IV. විගණකාධිපති
V. අධ්‍යක්ෂ, මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය